## <u>මොරටුව විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව</u>
## <u>විශ්වවිද්‍යාල ප්‍රවේශය - අධ්‍යයන වර්ෂය 2022/2023</u>

## <u>මොරටුව විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණ සඳහා අයදුම්පත් කැඳවීම.</u>

- **වාස්තු විද්‍යාව උපාධි පාඨමාලාව, නිර්මාණවේදය උපාධි පාඨමාලාව, භූමි නිර්මාණවේදය උපාධි පාඨමාලාව (වාස්තු විද්‍යා පීඨය)**
- **විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය උපාධි පාඨමාලාව (ඉංජිනේරු පීඨය)**
- **තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය (තොරතුරු තාක්ෂණ පීඨය)**

මොරටුව විශ්වවිද්‍යාලය මගින් මෙහෙයවන ඉහත යෝග්‍යතා පරීක්ෂණ සඳහා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල ප්‍රථම උපාධි පාඨමාලා හැදෑරීම සඳහා සිසුන් ඇතුලත් කිරීම පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා නිකුත් කර ඇති අත් පොතෙහි **අංක 1.2** කොටස යටතේ දක්වා ඇති අවම සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**ඉහත සඳහන් පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබා ගැනීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත මාර්ගගතව (Online) අයදුම්පත් යොමුකිරීමට අමතරව, මෙම යෝග්‍යතා පරීක්ෂණ වලටද පෙනී සිට ඉන් සමත්විය යුතුය.**

මෙම යෝග්‍යතා පරීක්ෂණවලට පෙනීසිටීම සඳහා වන අයදුම්කරුවන් අදාල එක් එක් පාඨමාලා යටතේ පහත දක්වා ඇති සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(1) <u>වාස්තු විද්‍යාව උපාධි පාඨමාලාව</u>
<u>(වාස්තු විද්‍යා පීඨය)</u>

මෙම පාඨමාලාව සඳහා වන අයදුම්කරුවන් 2022 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිට පහත දක්වා ඇති පරිදි විෂයයන් තුනකට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශ සුදුසුකම් සපුරා තිබිය යුතුය. (**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ප්‍රවේශ අත්පොත 2022/2023 හි අංක 1.2 සහ 2.2.8.6 ඡේද බලන්න**).

(i) පහත දැක්වෙන විෂයයන් අතුරින් **අවම වශයෙන් එක් විෂයයකට:**

| | | |
|---|---|---|
| චිත්‍ර | භූගෝල විද්‍යාව | ජීව විද්‍යාව |
| උසස් ගණිතය | රසායන විද්‍යාව | භෞතික විද්‍යාව |
| සංයුක්ත ගණිතය | | |

**සහ**

(ii) පහත දැක්වෙන විෂයයන් අතුරින් තෝරාගත් **අනෙක් විෂයය / විෂයයන් ට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.**

| | | |
|---|---|---|
| ගිණුම්කරණය | හින්දි | අරාබි |
| හින්දු ශිෂ්ඨාචාරය | බෞද්ධ ශිෂ්ඨාචාරය | ඉතිහාසය |
| ව්‍යාපාර සංඛ්‍යානය | ගෘහ ආර්ථික විද්‍යාව | ව්‍යාපාර අධ්‍යයන |
| ඉස්ලාම් ශිෂ්ඨාචාරය | චීන | ජපන් |
| ග්‍රීක හා රෝම ශිෂ්ඨාචාරය | තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය | ආර්ථික විද්‍යාව |
| දේශපාලන විද්‍යාව | ගණිතය | පාලි |
| ඉංග්‍රීසි | සංස්කෘත | ප්‍රංශ |
| සිංහල | ජර්මන් | දෙමළ |
| ක්‍රිස්තියානි ශිෂ්ඨාචාරය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | කෘෂි විද්‍යාව |
| සන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යයනය | | |

**<u>සටහන</u>** :

_ඉහත (i) යටතේ දක්වා ඇති විෂයයන් අතුරින් ඕනෑම විෂයයන් තුනක් සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශ සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ට ද ඉහත සඳහන් යෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම් කළ හැකිය.

**ඊට අමතරව, සියළුම අපේක්ෂකයින් පහත සඳහන් අවශ්‍යතාවයන්ද සපුරා තිබිය යුතුය.**

- අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.
- අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් හෝ අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ගණිතය විෂයයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

## (2) <u>නිර්මාණවේදය උපාධි පාඨමාලාව</u>
## <u>(වාස්තු විද්‍යා පීඨය)</u>

මෙම පාඨමාලාව සඳහා වන අයදුම්කරුවන් 2022 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිට ඕනෑම විෂයයන් තුනකට අවම වශයෙන් සාමාන්‍ය **(S)** සාමාර්ථ සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශ සුදුසුකම් සපුරා තිබිය යුතුය. **(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ප්‍රවේශ අත්පොත 2022/2023 හි අංක 1.2 සහ 2.2.8.9 ඡේද බලන්න**).

**ඊට අමතරව සියළුම අපේක්ෂකයින් පහත සඳහන් අවශ්‍යතාවයන්ද සපුරා තිබිය යුතුය.**

- අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.
- අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් හෝ අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ගණිතය විෂයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.
- අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී විද්‍යාව විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

**(3) <u>භූමි නිර්මාණවේදය උපාධි පාඨමාලාව</u>**
**<u>(වාස්තු විද්‍යා පීඨය)</u>**

මෙම පාඨමාලාව සඳහා වන අයදුම්කරුවන් 2022 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිට පහත දක්වා ඇති පරිදි විෂයයන් තුනකට අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ **(S)** සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශ සුදුසුකම් සපුරා තිබිය යුතුය. **(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ප්‍රවේශ අත්පොත 2022/2023 හි අංක 1.2 සහ 2.2.8.8 ඡේද බලන්න**).

(i) පහත දැක්වෙන විෂයයන් අතුරින් **අවම වශයෙන් එක් විෂයයකට**:

| | | |
|---|---|---|
| චිත්‍ර | භූගෝල විද්‍යාව | ජීව විද්‍යාව |
| උසස් ගණිතය | රසායන විද්‍යාව | භෞතික විද්‍යාව |
| සංයුක්ත ගණිතය | කෘෂි විද්‍යාව | |

**සහ**

(ii) පහත දැක්වෙන විෂයයන් අතුරින් තෝරාගත් **අනෙක් විෂයය / විෂයයන් ට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථ ලබා තිබිය යුතුය.**

| | | |
|---|---|---|
| ගිණුම්කරණය | හින්දි | අරාබි |
| හින්දු ශිෂ්ඨාචාරය | බෞද්ධ ශිෂ්ඨාචාරය | ඉතිහාසය |
| ව්‍යාපාර සංඛ්‍යානය | ගෘහ ආර්ථික විද්‍යාව | ව්‍යාපාර අධ්‍යයන |
| ඉස්ලාම් ශිෂ්ඨාචාරය | චීන | ජපන් |
| ග්‍රීක සහ රෝම ශිෂ්ඨාචාරය | තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය | ආර්ථික විද්‍යාව |
| දේශපාලන විද්‍යාව | ගණිතය | පාලි |
| ඉංග්‍රීසි | සංස්කෘත | ප්‍රංශ |
| සිංහල | ජර්මන් | දෙමළ |
| ක්‍රිස්තියානි ශිෂ්ඨාචාරය | සන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යයනය | |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | | |

**<u>සටහන</u>** :

ඉහත (i) යටතේ දක්වා ඇති විෂයයන් අතුරින් ඕනෑම විෂයයන් තුනක් සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශ සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ට ද ඉහත සඳහන් යෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම් කළ හැකිය.

**ඊට අමතරව, සියළුම අපේක්ෂකයින් පහත සඳහන් අවශ්‍යතාවයන්ද සපුරා තිබිය යුතුය.**

- අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක්ලබා තිබිය යුතුය.
- අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය විෂයට අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් හෝ අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී ගණිතය විෂයයට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

## (4) <u>විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය උපාධි පාඨමාලාව (ඉංජිනේරු පීඨය)</u>

මෙම පාඨමාලාව සඳහා වන අයදුම්කරුවන් 2022 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිට පහත දක්වා ඇති පරිදි විෂයයන් තුනකට අවම වශයෙන් සාමාන්‍ය **(S)** සාමාර්ථ සහිතව විශ්වවිද්‍යාල ප්‍රවේශ සුදුසුකම් සපුරා තිබිය යුතුය. **(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ප්‍රවේශ අත්පොත 2022/2023 හි අංක 1.2 සහ 2.2.8.7 ඡේද බලන්න**).

**ඊට අමතරව සියළුම අපේක්ෂකයින් පහත සඳහන් අවශ්‍යතාවයන් සපුරා තිබිය යුතුය.**

- අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි, ගණිතය සහ විද්‍යාව යන විෂයයන්ට අවම වශයෙන් සම්මාන **(C)** සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

## (5) <u>තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය (තොරතුරු තාක්ෂණ පීඨය)</u>

මෙම පාඨමාලාව සඳහා වන අයදුම්කරුවන් 2022 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිට පහත දක්වා ඇති විෂයයන් අතරින් **දෙකක් සඳහා සම්මාන (C) සාමාර්ථ සහිතව**, **විෂයයන් තුනක්** සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශ සුදුසුකම් සපුරා තිබිය යුතුය. **(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ප්‍රවේශ අත්පොත 2022/2023 හි අංක 1.2 සහ 2.2.8.22 ඡේද බලන්න**).

| | | |
|---|---|---|
| උසස් ගණිතය | භූගෝල විද්‍යාව | ව්‍යාපාර සංඛ්‍යානය |
| සංයුක්ත ගණිතය | තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය |
| ගිණුම්කරණය | ගණිතය | රසායන විද්‍යාව |
| ආර්ථික විද්‍යාව | භෞතික විද්‍යාව | |

**ඊට අමතරව සියළුම අපේක්ෂකයින් පහත සඳහන් අවශ්‍යතාවයන්ද සපුරාලිය යුතුය.**

- අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂයට අවම වශයෙන් සම්මාන **(C)** සාමාර්ථයක් ලබා තිබිය යුතුය.
- අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය විෂයට අවම වශයෙන් සම්මාන **(C)** සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

- **විභාග පැවැත්වෙන දිනයන් :**

| උපාධි පාඨමාලාව | විභාගය පැවැත්වෙන | විභාගය පැවැත්වෙන දිනය |
|---|---|---|
| ▪ වාස්තු විද්‍යාව<br>▪ භූමි නිර්මාණවේදය<br>(වාස්තු විද්‍යා පීඨය) | **පෙ.ව 9.30 සිට ප.ව 12.00** | **2023.10.29** |
| ▪ නිර්මාණවේදය<br>(වාස්තු විද්‍යා පීඨය) | **ප.ව 1.30 සිට ප.ව 4.00** | |
| ▪ තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය<br>(තොරතුරු තාක්ෂණ පීඨය) | **පෙ.ව 9.00 සිට ප.ව 12.00** | **2023.11.04** |
| ▪ විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය<br>(ඉංජිනේරු පීඨය | **ප.ව 1.30 සිට ප.ව 4.00** | |

- **අයදුම්පත් ඉදිරිපත් කිරීම**

සියළුම අයදුම්කරුවන් මොරටුව විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය හි (http://www.uom.lk) ඇතුළත් අයදුම්පත්‍රය මාර්ගගතව (online) සම්පූර්ණ කළ යුතුය. එසේ සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය සමඟ ගෙවීම් වවුචරය සහ පාසලේ විදුහල්පති හෝ සමාදාන විනිසුරුවරයෙකු හෝ රජයේ විධායක ශ්‍රේණියේ නිලධාරියෙකු විසින් සහතික කරන ලද අ.පො.ස. (සාමාන්‍ය පෙළ), අ.පො.ස. (උසස් පෙළ) ප්‍රතිඵල ලේඛණවල ස්කෑන් කරන ලද පිටපත් උඩුගත (upload) කළ යුතුය.

වෙබ් අඩවියෙන් ලබා ගන්නා ලද අ.පො.ස. (උසස් පෙළ) ප්‍රතිඵල ලේඛණ ඉදිරිපත් කරන්නේ නම් ඒවායෙහි අපේක්ෂකයාගේ නම සඳහන් විය යුත අතර එම ලේඛණ විදුහල්පති හෝ සමාදාන විනිසරුවරයෙකු හෝ රජයේ විධායක ශ්‍රේණියේ නිලධාරියෙකු විසින් සත්‍ය පිටපතක් බවට සහතික කර නිල මුද්‍රාව තබා ඉදිරිපත් කළ යුතුය.

- **යෝග්‍යතා පරීක්ෂණ ගාස්තු**

ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකින් මොරටුව විශ්වවිද්‍යාලයේ උප කුලපති නමට **(ගිණුම් අංකය 306836 කටුබැද්ද ශාඛාව)** නිකුත් කරන ලද ගෙවීම් වවුචරයෙහි ඔබගේ නම සහ හැදුනුම්පත් අංකය පැහැදිලිව සඳහන් කර ස්කෑන් කරන ලද පිටපතක් යෝග්‍යතා පරීක්ෂණ ගාස්තු වශයෙන් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය. **(ස්වංක්‍රිය ටෙලර් යන්ත්‍රය (ATM) , චෙක්පත්, තැපැල්/ මුදල් ඇනවුම් භාරගනු නොලැබේ.)**

එක් පාඨමාලාවක් සඳහා යෝග්‍යතා පරීක්ෂණ ගාස්තු වශයෙන් රු. 1.500/- ක මුදලක් අය කරනු ලැබේ. ඔබ එක් පාඨමාලාවකට වැඩි පාඨමාලා ගණනකට අයදුම්කරන්නේ නම් පහත දක්වා ඇති පරිදි මුදල් ගෙවන ලද ගෙවීම් වවුචරයක ස්කෑන් කරන ලද පිටපතක් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය.

එක් පාඨමාලාවක් සඳහා - රු. 1.500/-
පාඨමාලා දෙකක් සඳහා - රු. 3.000/-
පාඨමාලා තුනක් සඳහා - රු. 4.500/-
පාඨමාලා හතරක් සඳහා - රු. 6.000/-
පාඨමාලා පහක් සඳහා - රු. 7.500/-

▪ **සැලකිය යුතුයි**

(i) අයදුම්පත්‍රයෙහි සහ සහතිකපත්‍ර වල සඳහන් නම් අතර වෙනසක් ඇත්නම් එම නම් වලින් හැඳින්වෙන්නේ එකම පුද්ගලයෙකු බවට සහතික කළ දිවුරුම් පෙත්සමක ස්කෑන් කරන ලද පිටපතක් අයදුම්පත්‍රය සමඟ උඩුගත (upload) කළ යුතුය.

(ii) එක් එක් යෝග්‍යතා පරීක්ෂණය සඳහා සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් වෙත අදාළ ප්‍රවේශ පත්‍ර ඔහු/ඇය විසින් පරීක්ෂණය සඳහා ලියාපදිංචිවීමේ දී භාවිත කළ විද්‍යුත් තැපැල් ලිපිනය ඔස්සේ දැනුම් දෙනු ඇත. එබැවින් පරීක්ෂණය සඳහා ලියාපදිංචිවීමේ දී වලංගු විද්‍යුත් තැපැල් ලිපිනයක් භාවිත කිරීමට සැළකිළිමත් විය යුතුය.

(iii) අවම සුදුසුකම් සපුරා නොමැති අපේක්ෂකයින් විසින් ගෙවන ලද යෝග්‍යතා පරීක්ෂණ ගාස්තු කුමන හේතුවක් නිසාවත් නැවත ගෙවනු නොලැබේ.

(iv) පහත දක්වා ඇති කරුණු මත ඔබේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප විය හැකිය.
- මාර්ගගත අයදුම්පත්‍රය (Online Application) අසම්පූර්ණ වීම.
- විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අපේක්ෂිත අවම ප්‍රවේශ අවශ්‍යතා සපුරා නොතිබීම හා යෝග්‍යතා පරීක්ෂණයකට පෙනී සිටීමට අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබීම.

(v) යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වීම පමණක් උපාධි පාඨමාලාවට ඇතුළත් කර ගැනීම සඳහා සුදුසුකමක් නොවේ.

(vi) අපේක්ෂකයා විසින් මාර්ගගත අයදුම්පත්‍රය (Online Application) යොමු කිරීමෙන් පසුව එහි කිසිදු වෙනස්කමක් සිදුකිරීමට නොහැකි බැවින්, එය සම්පූර්ණ කිරීමේදී සියළු කරුණු නිවැරදි දැයි තහවුරු කර ගැනීමෙන් අනතුරුව අයදුම්පත්‍රය යොමුකිරීමට වගබලා ගත යුතුය.

▪ **යෝග්‍යතා පරීක්ෂණය සඳහා සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගේ නාම ලේඛනය**

යෝග්‍යතා පරීක්ෂණය සඳහා සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගේ නාම ලේඛනය යෝග්‍යතා පරීක්ෂණය පැවැත්වෙන දිනයට දින දෙකකට පෙර මොරටුව විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙහි පළ කරනු ලැබේ. විභාග ප්‍රවේශ පත්‍රය හෝ වෙනත් කරුණු සම්බන්ධ පැමිණිලි හෝ වැඩිදුර තොරතුරු දැනගැනීම සඳහා පහත විද්‍යුත් තැපැල් ලිපිනය භාවිතා කරන්න.
ඊමේල් - admissions@uom.lk

▪ **අයදුම්පත් භාරගන්නා අවසන් දිනය**

මාර්ගගතව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය (Online Application) අදාළ ලියකියවිලි සමඟ **2023 ඔක්තෝම්බර් මස 03 වන දින ප.ව. 6.00 ට පෙර** යොමු කළ යුතුය. මෙම දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

විභාග හා ලියාපදිංචි කිරීමේ අංශය
මොරටුව විශ්වවිද්‍යාලය,
කටුබැද්ද,
මොරටුව.
2023.09.06